# ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

## (NAQDA)

# පුරප්පාඩු

අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් පහත තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

### තනතුරු 01: විගණන නිලධාරී

**සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගිණුම්කරණය / මූල්‍ය / ව්‍යාපාර කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය / වාණිජ්‍ය පිළිබඳ හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක උපාධියක් ලබා තිබීම.

   හෝ

2. තනතුරට අදාළ විෂයයක පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම විභාගය සමත්ව තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත සඳහන් කළ බාහිර අයදුම්කරුවන් විසින් සැපිරිය යුතු සුදුසුකම් ලබා තිබීම.

   හෝ

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය තුළ කළමනාකරණ සහායක - තාක්ෂණික නොවන (MA 1-1) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (5) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

   හෝ

3. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය තුළ කළමනාකරණ සහායක / තාක්ෂණික (MA 2-1) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (5) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**රැකියා සාරාංශය**

අභ්‍යන්තර පරීක්ෂා කිරීමේ සහ අභ්‍යන්තර පාලන පද්ධතියට අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්, විගණන ප්‍රමිතීන් සහ අභ්‍යන්තර විගණනයේ අදාළ ක්‍රියාකාරකම් ඵලදායී හා කාර්යක්ෂමව ඉටු කරමින් අධිකාරියේ අභ්‍යන්තර විගණකවරයාට වගකිව යුතුය. කළමනාකාරීත්වයේ සහ විගණන සහ කළමනාකරණ කමිටුවේ අනුමැතිය සඳහා වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීමට අභ්‍යන්තර විගණකට සහාය වීම. ප්‍රසම්පාදන ක්‍රියාවලිය, ගිණුම්කරණ ක්‍රියාවලිය, ගෙවීම් ක්‍රියාවලිය, නිෂ්පාදන ක්‍රියාවලිය ආදී විගණනයට අදාළ ගුණාත්මක ප්‍රගති වාර්තාව සහ අනෙකුත් වාර්තා සකස් කිරීම, විමර්ශන සිදු කිරීම සහ පරීක්ෂා කිරීම. ප්‍රධාන කාර්යාලයේ සහ මධ්‍යස්ථාන, ව්‍යාප්ති කාර්යාලය, ක්ෂේත්‍ර කාර්යාලය ආදියෙහි ගිණුම් සහ කාර්යයන් විගණනය කිරීම.

**වැටුප් පරිමාණය :** JM 1-1 2016 : [42,600 - 10 x 755 - 18 x 1,135 - 70,580]

### තනතුරු 02: විමර්ශන නිලධාරී

**සුදුසුකම් සහ පළපුරුද්ද:**

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය/ ව්‍යාපාර කළමනාකරණය/ව්‍යාපාර පරිපාලන/ රාජ්‍ය පරිපාලනය /රාජ්‍ය කළමනාකරණය/වාණිජ්‍ය පිළිබඳ හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක උපාධියක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත සඳහන් කළ බාහිර අයදුම්කරුවන් විසින් සැපිරිය යුතු සුදුසුකම් ලබා තිබීම.

   හෝ

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය තුළ කළමනාකරණ සහායක - තාක්ෂණික නොවන (MA 1-1) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (5) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**රැකියා සාරාංශය**

පූර්ණ කාලීන විමර්ශන ක්‍රියාවලීන් සංවිධානය කිරීම සහ කළමනාකරණය කිරීම. මූලික විමර්ශන පැවැත්වීම (ප්‍රධාන කාර්යාලය, ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන සහ දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාල) සහ විධිමත් විමර්ශන සම්බන්ධීකරණය කිරීම. කම්කරු විනිශ්චය සභා නඩු, අධිකරණ නඩු වලට සහභාගී වීම සහ පොලිස් දෙපාර්තමේන්තුව සමග අදාළ නඩු සම්බන්ධීකරණය කිරීම.

**වැටුප් පරිමාණය :** JM -1 - 1- 2016 - [42,600 - 10 x 755 - 18 x 1135 - 70,580]

### තනතුරු 03: ප්‍රසම්පාදන නිලධාරී

**සුදුසුකම් සහ පළපුරුද්ද:**

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වාණිජ්‍ය/ ආර්ථික විද්‍යාව/ කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය තුළ කළමනාකරණ සහායක - තාක්ෂණික නොවන (MA 1-1) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (5) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**රැකියා සාරාංශය**

භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය, මිල ගණන් කැඳවීම සහ ටෙන්ඩර් සහ ටෙන්ඩර් ලේඛන සකස් කිරීම, භාණ්ඩ හා සේවා සඳහා සැපයුම්කරුවන් සම්බන්ධ කර ගැනීම, තාක්ෂණික ඇගයීම් සඳහා අවශ්‍ය කටයුතු සකස් කිරීම, ටෙන්ඩර් මණ්ඩල රැස්වීම් පැවැත්වීම, ප්‍රධානය කිරීමේ ලිපි සකස් කිරීම යනාදිය.

**වැටුප් පරිමාණය :** JM -1 - 1- 2016 - [42,600 - 10 x 755 - 18 x 1135 - 70,580]

### තනතුරු 04: තාක්ෂණ නිලධාරී

**සුදුසුකම් සහ පළපුරුද්ද:**

**බාහිර අයදුම්කරුවන්**

1. සිවිල් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද NVQ 5 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. බාහිර අයදුම්කරුවන් විසින් සැපිරිය යුතු සුදුසුකම් ලබා තිබීම.

**රැකියා සාරාංශය**

සිවිල් වැඩ කටයුතු වලට අදාළ තාක්ෂණික දත්ත සහ තොරතුරු මැනීම සහ එකතු කිරීම, සැලසුම් සැලසුම්, ප්‍රමාණ බිල්පත් සහ ඇස්තමේන්තු සකස් කිරීම, කොන්ත්‍රාත් පරිපාලනය, චංචල සහ නිශ්චල යටිතල පහසුකම් ඉදිකිරීම සහ නඩත්තු කිරීම අධීක්ෂණය කිරීම ඇතුළුව ජලජීවී වගා පිළිවෙත් ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය කිරීම සම්බන්ධ සිවිල් කටයුතු.

**වැටුප් පරිමාණය :** MA 2 - 1- 2016 - [30,310 - 10 x 300 - 7 x 350 - 4 x 495 - 20 x 660 - 50,940]

**පොදු කොන්දේසි :**

01. අවුරුදු 22 ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.
02. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
03. තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
04. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
05. රජය විසින් නිකුත් කළ නව වැටුප් චක්‍රලේඛයට අනුව වැටුප සකස් කරනු ලැබේ.
06. රජයේ/පළාත් පාලන දෙපාර්තමේන්තු/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අපේක්ෂකයින් තම අයදුම්පත්‍ර අදාළ ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.
07. සම්පූර්ණ විස්තර ඇතුළත් අයදුම්පත් (සහතිකවල ඡායා පිටපත් සමග), **2025 අප්‍රේල් 04** වන දින හෝ ඊට පෙර, **"සභාපති, ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, අංක 41/1, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල"** යන ලිපිනයට, අයදුම් කරන තනතුර ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය.**

SELADINE